ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No .

දිනය / திகதி / Date. 2025. 03. 12

එම්. එම්. රුවිනි ධම්මිකා විජේසූරිය,
27 කණුව, හබරණ පාර
බටුඔය,
මින්නේරිය

පැමිණිලිකාරිය

1. එම්. සුමිත් චන්දන
උප පොලිස් පරීක්ෂක
(වර්තමානයේ පොලිස් පරීක්ෂක)
පොලිස් ස්ථානය
මැදිරිගිරිය

2. එන්. පී. එස්. ජයලත්
ස්ථානාධිපති (හිටපු)
පොලිස් ස්ථානය
මැදිරිගිරිය
(වර්තමාන සේවා ස්ථානය :
පොලිස් ස්ථානය, කුරුණෑගල)

වගඋත්තරකරුවන්

**පැමිණිලි අංකය: HRC/AP/225/2018 (S)**

**පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම**

පැමිණිලිකාරිය තම පැමිණිල්ල මගින් ප්‍රකාශ කර සිටින්නේ, තමා මැදිරිගිරිය රෝහලේ සෞඛ්‍ය කාර්ය සහායිකාවක ලෙස සේවය කරන බවත්, 2018.05.17 වන දින ඇය බාහිර රෝගී අංශයේ රාජකාරී කළ බවත්, එදින වෛද්‍යවරුන්ගේ වැඩ වර්ජන දිනයක් වූ බවත්, සේවය අවසන් කර සවස 5.30 ට පමණ නිවසට ගිය බවත් ය.

2018.05.17 වන දින මැදිරිගිරිය රෝහලේ සේවය කරන හෙද නිලධාරිනියක වන දූෂාන්ති හබක්කල යන අය භාරයේ තිබූ පරිගණක යන්ත්‍රයක් නැතිවීම හේතුවෙන් ඇය විසින් මැදිරිගිරිය පොලිස් ස්ථානය වෙත පැමිණිල්ලක් සිදු කර ඇති බවත්, එකී පැමිණිල්ලට අදාළව මැදිරිගිරිය පොලිස් ස්ථානයේ උප පොලිස් පරීක්ෂක චන්දන යන අය පැමිණ රෝහල් කාර්ය මණ්ඩලයේ කිහිප දෙනෙකුගෙන් ප්‍රකාශ



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

ලබාගත් බවත්, තමාගෙන් ද ප්‍රකාශයක් ලබාගත් බවත් පැමිණිලිකාරිය විසින් සිය පැමිණිල්ල තුළින් දක්වා ඇත.

තවද, 2018.05.23 වන දින මැදිරිගිරිය රෝහලේ වෛද්‍ය අධිකාරි එස්.එස්.යාපා මහතාගේ නිල කාමරය වෙත කැඳවා ඉහත කී නැති වූ පරිගණක යන්ත්‍රය ඇය විසින් රැගෙන ගියේ ද කියා ඇසූ බවත්, එවැනි පරිගණක යන්ත්‍රයක් ඇය විසින් රැගෙන නොගිය බවට පැවසීමෙන් පසුව මැදිරිගිරිය රෝහලේ සේවය කරන සෞඛ්‍ය කාර්ය සහායක සමන් බණ්ඩාර යන අය ද වෛද්‍ය අධිකාරිගේ කාමරයට කැඳවූ බවත්, එහිදී සමන් බණ්ඩාර යන අය විසින් නැතිවූ බව කියන පරිගණක යන්ත්‍රය පැමිණිලිකාරිය විසින් රැගෙන ගිය බව වෛද්‍ය අධිකාරිට ප්‍රකාශ කර සිටි බවත් පැමිණිලිකාරිය විසින් සඳහන් කර ඇත. එවිට මැදිරිගිරිය රෝහලේ වෛද්‍ය අධිකාරි විසින් ඒ සම්බන්ධයෙන් නීතිමය පියවර ගන්නා බවට පැවසූ බවත්, එම අවස්ථාවේම මැදිරිගිරිය පොලිස් ස්ථානය වෙත දුරකථන ඇමතුමක් ගෙන පැමිණිලිකාරිය අත්අඩංගුවට ගන්නා ලෙස දන්වා සිටි බවත්, ඒ අනුව උප පොලිස් පරීක්ෂක චන්දන යන අය පැමිණ ඇයව අත්අඩංගුවට ගන්නා ලද බවත් පැමිණිලිකාරිය විසින් දක්වා ඇත.

ඒ අනුව උප පොලිස් පරීක්ෂක චන්දන යන නිලධාරියා සහ තවත් කාන්තා පොලිස් නිලධාරිනියක් සමඟ ඇය ජීප් රථයෙන් මැදිරිගිරිය පොලිස් ස්ථානයට රැගෙන ගිය බවත්, ඒ සමගම සෞඛ්‍ය කාර්ය සහායක සමන් බණ්ඩාර හා මුරකරු ලහිරු මලින්ද යන දෙදෙනා ද පොලිස් ස්ථානයට රැගෙන ගිය බවත්, ඔවුන්ගේ ප්‍රකාශ ලබාගෙන නැවත යවන ලද බවත්, තමාගෙන් ද ප්‍රකාශයක් ලබාගෙන අංක B/544/2018 යටතේ පරිගණකයක් නැතිවීම සම්බන්ධයෙන් හිඟුරක්ගොඩ ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කළ බවත් පැමිණිලිකාරිය විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

<u>වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>

පැමිණිල්ල සම්බන්ධයෙන් අංක 2416/2018 සහ 2018.09.10 දිනැති වාර්තාව මගින් කරුණු දක්වමින් 2 වන වගඋත්තරකාර මැදිරිගිරිය පොලිස් ස්ථානයේ ස්ථානාධිපති විසින් ප්‍රකාශ කර සිටින්නේ, මැදිරිගිරිය පොලිස් ස්ථානය වෙත ලද පැමිණිල්ලක් මත හා ලද සාක්ෂි මත පැමිණිලිකාරිය අත්අඩංගුවට ගෙන ඇති බවයි.

එසේම, පැමිණිලිකාරිය 2018.05.23 වන දින පැය 12.40ට අත්අඩංගුවට ගෙන ඇති බවත්, ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 367 වන වගන්තිය යටතේ කරන ලද වරදක් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගැනීම සිදුව ඇති බවත්, 2018.05.24 දින පැය 11.30ට ගරු අධිකරණය වෙත ඉදිරිපත් කළ බවත් ඉහත කී වාර්තාව මගින් 2 වන වගඋත්තරකාර මැදිරිගිරිය පොලිස් ස්ථානයේ ස්ථානාධිපති විසින් දක්වා ඇත.

පැමිණිලිකාරිය අත්අඩංගුවට ගැනීම සිදුකළ 1 වන වගඋත්තරකාර උප පොලිස් පරීක්ෂක එම්.සුමිත් චන්දන යන අය ප්‍රකාශ කර සිටින්නේ මැදිරිගිරිය රෝහලේ තිබූ ලැප්ටොප් පරිගණක යන්ත්‍රයක් නැතිවීම සම්බන්ධයෙන් වන පැමිණිල්ලක් 2018.05.17 දින මැදිරිගිරිය පොලිස් ස්ථානය වෙත ලැබී තිබූ බවත්, මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් වන විමර්ශනයක් තමන් ඇතුළු නිලධාරීන් කණ්ඩායමක් විසින් සිදුකළ

බවත්, එකී විමර්ශනයේදී අදාළ ලැප්ටොප් පරිගණකය මගින් රාජකාරි කටයුතු කරන ලද නිලධාරිනිය විනාඩි 05ක් හෝ 10ක් සඳහා අවශ්‍යතාවයකට එළියට ගොස් ඇති බවත්, නැවත විනාඩි 05 – 10ක් අතර කාමරයට පැමිණි පසු පරිගණකය තිබී නැති බව අනාවරණය වූ බවත් ය.

2018.05.17 වන දින රජයේ වෛද්‍ය නිලධාරීන් විසින් වැඩ වර්ජනයක් සිදුකර ඇති බවත්, ඒ හේතුවෙන් එදින මැදිරිගිරිය රෝහලේ බාහිර රෝගී අංශයේ රෝගීන් සිට නොමැති බවත්, මෙදින රාජකාරියේ යෙදී සිටි නිලධාරින්ගෙන් ලබාගත් ප්‍රකාශ මගින් කරුණු අනාවරණය වූ බවත්, එම අවස්ථාවේ ලද තොරතුරු හා ප්‍රකාශ මත පදනම්ව මෙම පැමිණිලිකාරිය සැකපිට අත්අඩංගුවට ගෙන ගරු අධිකරණය වෙත ඉදිරිපත් කළ බවත් 1 වන වගඋත්තරකාර උප පොලිස් පරීක්ෂක එම්.සුමිත් චන්දන යන අය විසින් සඳහන් කර ඇත.

<u>නිරීක්ෂණ</u>

පැමිණිලිකාරිය තම පැමිණිල්ල මගින් ප්‍රකාශ කර සිටින්නේ තමන් නොකළ වරදක් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන ගරු අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් පැමිණිලිකාරියගේ අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවයි.

1 වන වගඋත්තරකාර උප පොලිස් පරීක්ෂක එම්.සුමිත් චන්දන යන අය ප්‍රකාශ කර සිටින්නේ, මැදිරිගිරිය පොලිස් ස්ථානය වෙත ලද පැමිණිල්ලක් මත විමර්ශනයක් සිදුකළ බවත්, එම විමර්ශනයේදී අනාවරණය කරගන්නා ලද තොරතුරු මත පදනම්ව මෙම පැමිණිලිකාරිය අදාළ සොරකම සිදුකළ බවට සාධාරණ සැකයක් පැවති බැවින් සැකපිට අත්අඩංගුවට ගත් බවත්, පැමිණිලිකාරියගේ අයිතිවාසිකම් උල්ලංඝනය නොකළ බවත් ය.

මැදිරිගිරිය රෝහලේ ලැප්ටොප් පරිගණකයක් නැතිවීම සම්බන්ධයෙන් වන පැමිණිල්ලක් 2018.05.17 වන දින පැය 19.20 ට මැදිරිගිරිය පොලිස් ස්ථානය වෙත ලැබී ඇති බවත්, එම පැමිණිල්ල සිදුකර ඇත්තේ එම රෝහලේ හෙද නිලධාරිනියක වන හබක්කල කංකානමගේ දූෂාන්ති චමිලා හබක්කල යන අය විසින් වන බවත්, මැදිරිගිරිය පොලිස් ස්ථානයේ සුළු පැමිණිලි සටහන් පොතේ පිටුව 218 සහ ඡේදය 287 යටතේ යොදා ඇති සටහන අනුව නිරීක්ෂණය වේ. එසේම, එම පැමිණිල්ල මගින් හෙද නිලධාරිනිය ප්‍රකාශ කොට ඇත්තේ, 2018.05.17 වන දින සවස 15.50ට පමණ තමා මෙම ලැප්ටොප් පරිගණකය පාවිච්චි කරමින් සිට හදිසි අවශ්‍යතාවයක් සඳහා රෝහලේ හෙදියන් භාර නිලධාරිනිය හමුවීම සඳහා ගිය බවත්, පැය 15.52ට පමණ නැවත නිල කාමරයට පැමිණි බවත්, එසේ පැමිණෙන විට ලැප්ටොප් යන්ත්‍රය නිල කාමරය තුළ නොතිබූ බවත් ය.

තවද, 2 වන වගඋත්තරකරු වන මැදිරිගිරිය පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයාගේ නියෝග පරිදි මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු කිරීම සඳහා 2018.05.18 වන දින උප පොලිස් පරීක්ෂක චන්දන හා පොලිස් කොස්තාපල් 35940 පරාක්‍රම යන නිලධාරීන් විසින් පැය 09.36ට පිටුව 223, ඡේදය 294 යටතේ පිටව යාමේ සටහන් යොදා පොලිස් ස්ථානයෙන් පිටව ගොස් ඇති බවත්,

අපරාධ ස්ථානයේදී ඔහුගේ නිරීක්ෂණ සටහන් යොදා ඇති බවත්, මෙම විමර්ශනයේදී සාක්ෂිකරුවන්ගෙන් සාක්ෂි ද සටහන් කරගෙන ඇති බවත් මැදිරිගිරිය පොලිස් ස්ථානයේ සුළු පැමිණිලි සටහන් පොතේ උධෘත අනුව නිරීක්ෂණය වේ.

1 වන වගඋත්තරකරු විසින් 2018.05.18 වන දින සිදුකරන ලද විමර්ශනයේදී මැදිරිගිරිය රෝහලේ සේවය කරනු ලබන තිදෙනෙකුගෙන් සහ ලැප්ටොප් පරිගණකය නැති වූ බවට පොලිස් ස්ථානය වෙත පැමිණිලි කරන ලද හෙද නිලධාරිනිය වෙතින් ප්‍රකාශ ලබාගෙන ඇති බව මැදිරිගිරිය පොලිස් ස්ථානයේ සුළු පැමිණිලි සටහන් පොතේ 2018.05.18 වන දින පැය 13.30ට පිටුව 224, ඡේදය 297 යටතේ යොදා ඇති සටහන අනුව නිරීක්ෂණය වේ.

ඒ අනුව 1 වන වගඋත්තරකරු සමඟ විමර්ශන කටයුතු සඳහා පිටත්ව ගිය ඉහත කී පොලිස් කොස්තාපල් 35940 පරාක්‍රම යන නිලධාරියා විසින් මැදිරිගිරිය රෝහලේ සෞඛ්‍ය කාර්ය සහායිකාවක ලෙස සේවය කරන ඩබ්.බී.එම්. හර්ෂණී දිස්නා කුමාරි විජේසූරිය යන අයගෙන් ප්‍රකාශයක් සටහන් කරගෙන ඇති අතර, එම ප්‍රකාශය මගින් ඇය ප්‍රකාශ කර ඇත්තේ, ඇය 2018.05.17 වන දින සවස 3.45ට පමණ බෙහෙත් විදින කටු තැම්බීම සඳහා ගිය බවත්, එවිට ඉහත කී දූෂාන්ති හබක්කල නම් හෙදිය කතාකර එම හෙදියගේ නිල කාමරයේ තිබූ ලැප්ටොප් යන්ත්‍රය නැති වී ඇති බැවින් නිල කාමරය වෙත පැමිණෙන ලෙසට පවසා සිටි බවත්, එහි ගිය විට ලැප්ටොප් යන්ත්‍රය නොමැති බව දුටු බවත් ය.

එසේම, කොමිෂන් සභාව වෙත යොමු කර ඇති මෙම පැමිණිල්ලේ පැමිණිලිකාරිය වන එම්. එම්. රුවිනි ධම්මිකා විජේසූරිය යන අයගෙන් ද 2018.05.18 වන දින පොලිස් කොස්තාපල් 35940 පරාක්‍රම යන නිලධාරියා විසින් මේ සම්බන්ධයෙන් ප්‍රකාශ සටහන් කරගෙන ඇති අතර, ඇයගේ ප්‍රකාශය මගින් පවසා ඇත්තේ, 2018.05.17 වන දින සවස 3.55ට පමණ ඉහත කී දූෂාන්ති හබක්කල නම් හෙදිය තුන්ඩු ලියන තැනදී හමුවූ බවත්, එහිදී තම නිල කාමරයේ තිබූ ලැප්ටොප් යන්ත්‍රය නැති වී ඇති බව හෙදිය විසින් දන්වා සිටි බවත් ය.

එමෙන්ම, පොලිස් කොස්තාපල් 35940 පරාක්‍රම යන නිලධාරියා විසින් 2018.05.18 වන දින මැදිරිගිරිය රෝහලේදී රෝහල් මුරකරුවෙකු වශයෙන් සේවය කරනු ලබන එස්.ජී. වසන්ත ප්‍රේමලාල් යන අයගෙන් ද ප්‍රකාශයක් සටහන් කරගෙන ඇති අතර, එම ප්‍රකාශය මගින් ඔහු ප්‍රකාශ කොට ඇත්තේ, 2018.05.17 වන දින උදේ 6.30ට වැඩ ආරම්භ කළ බවත්, සවස 06.30 දක්වා රාජකාරී කිරීමට පැවරී තිබූ බවත්, ඔහුට එම රෝහලේ තවත් මුරකරුවෙකු විසින් කාර්යාලය අසලට පැමිණෙන ලෙසට දුරකථනය මගින් දන්වා සිටි බවත්, ඒ අනුව තමා රෝහලේ බාහිර රෝගී අංශය අසලට ගිය පසු බෙහෙත් විදින කාමරයේ ලැප්ටොප් යන්ත්‍රය නැතිවී ඇති බව එකී අනෙක් මුරකරු විසින් පැවසීමත් සමඟ ලැප්ටොප් යන්ත්‍රයක් නැතිවී ඇති බව තමා දැනගත් බවත් ය.

තවද, 1 වන වගඋත්තරකරු විසින් පොලිස් කොස්තාපල් 35940 පරාක්‍රම යන නිලධාරියා ලවා ලැප්ටොප් යන්ත්‍රය නැතිවීම සම්බන්ධයෙන් පොලිස් ස්ථානය වෙත පැමිණිල්ල ඉදිරිපත් කරන ලද හෙද නිලධාරිණියගෙන් ද 2018.05.18 දින ප්‍රකාශයක් සටහන් කොට ඇති අතර, එම ප්‍රකාශය මගින් හෙද

නිලධාරිණිය ප්‍රකාශ කොට ඇත්තේ, ලැප්ටොප් යන්ත්‍රය නැතිවීම සම්බන්ධයෙන් 2018.05.17 දින මැදිරිගිරිය පොලිස් ස්ථානය වෙත පැමිණිල්ලක් සිදු කළ බවයි.

මැදිරිගිරිය පොලිස් ස්ථානයේ සුළු පැමිණිලි සටහන් පොතේ 2018.05.23 දින පැය 11.00ට පිටුව 309, ඡේදය 358 යටතේ යොදා ඇති සටහනට අනුව 2018.05.23 දින මැදිරිගිරිය රෝහලේ වෛද්‍ය අධිකාරී විසින් 2 වන වගඋත්තරකරු වන ස්ථානාධිපතිවරයා වෙත සිදු කළ දැනුම්දීමකට අනුව 1 වන වගඋත්තරකරු වන උප පොලිස් පරීක්ෂක එම්. සුමිත් චන්දන, පොලිස් කොස්තාපල් 38190, පොලිස් කොස්තාපල් 50489 සහ කාන්තා පොලිස් කොස්තාපල් 2364 යන නිලධාරීන් මැදිරිගිරිය රෝහල වෙත වැඩිදුර පරීක්ෂණ සඳහා පිටත්ව ගොස් ඇති බව නිරීක්ෂණය වේ.

එසේම, එදින 1 වන වගඋත්තරකරු විසින් මැදිරිගිරිය රෝහලේ වෛද්‍ය අධිකාරීවරයා හමුවී ඇති බවටත්, එහිදී වෛද්‍ය අධිකාරී විසින් සාක්ෂිකරුවන් 04 දෙනෙකු ඔහු වෙත ඉදිරිපත් කර ඇති බවටත්, කරුණු නිරීක්ෂණය වන අතර, 1 වන වගඋත්තරකරු වෙත ඉදිරිපත් කළ සාක්ෂිකරුවන්ගෙන් ප්‍රකාශ සටහන් කරගෙන ඇති බවද නිරීක්ෂණය වේ. වෛද්‍ය අධිකාරී විසින් 1 වන වගඋත්තරකරු වෙත ඉදිරිපත් කරන ලද සාක්ෂිකරුවන්ගෙන් අනාවරණය වූ සාක්ෂි අනුව පැමිණිලිකාරිය වන රුවනි ධම්මිකා යන අය අපරාධයට සම්බන්ධ බවට වෛද්‍ය අධිකාරී විසින් 1 වන වගඋත්තරකරු වෙත ඉදිරිපත් කළ බවත්, මෙම පැමිණිලිකාරිය විසින් අදාල අපරාධය සිදුකර ඇති බවට වෛද්‍ය අධිකාරී විසින් ප්‍රකාශ කර ඇති බවත්, එසේහෙයින් මැදිරිගිරිය මූලික රෝහලේදී නැතිවූ ලැප්ටොප් පරිගණක යන්ත්‍රය සොරකම් කිරීමේ වරද කියාදී 2018.05.23 දින පැය 12.04ට පැමිණිලිකාරිය අත්අඩංගුවට ගත් බවත් 1 වන වගඋත්තරකරු විසින් සටහන් කර ඇති බව මැදිරිගිරිය පොලිස් ස්ථානයේ සුළු පැමිණිලි සටහන් පොතේ 2018.05.23 වන දින පැය 14.05ට පිටුව 312 සහ ඡේදය 361 යටතේ යොදා ඇති සටහන අනුව නිරීෂණය වේ.

තවද, මැදිරිගිරිය පොලිස් ස්ථානයේ සුළු පැමිණිලි සටහන් පොතෙහි 2018.05.23 වන දින පැය 14.05ට පිටුව 312, ඡේදය 361 යටතේ අලවා ඇති සටහන අනුව රෝහලේ වෛද්‍ය අධිකාරීවරයා විසින් 1 වන වගඋත්තරකරු වෙත ඉදිරිපත් කර ඇති සාක්ෂිකරුවන් සිව්දෙනා අතරින් රෝහලේ සෞඛ්‍ය කාර්ය සහායකයෙකු වන වන්සූරිය මුදියන්සේලාගේ සමන් බණ්ඩාර යන අයගෙන්, 1 වන වගඋත්තරකරු සමඟ වැඩිදුර පරීක්ෂණ සඳහා මැදිරිගිරිය රෝහල වෙත පැමිණි පොලිස් කොස්තාපල් 50489 වික්‍රමසිංහ නිලධාරියා විසින් 2018.05.23 වන දින පැය 12.03ට ප්‍රකාශයක් සටහන් කොට ඇති අතර, වන්සූරිය මුදියන්සේලාගේ සමන් බණ්ඩාර යන අය විසින් ප්‍රකාශ කොට ඇත්තේ, 2018.05.17 දින ඔහු සේවයට නොපැමිණි බවත්, මේ පිළිබඳව ඔහුට ආරංචි වූ බවත්, මෙම පරිගණක යන්ත්‍රය අරගෙන තියෙන්නේ රුවනි බවට සියලු දෙනා පවසන බවත් ය.

එසේම, 2018.05.23 දින පැය 12.20ට පොලිස් කොස්තාපල් 50489 වික්‍රමසිංහ නිලධාරියා විසින් රාජපක්ෂ පතිරනලාගේ නාමල් උදයකුමාර යන සෞඛ්‍ය මුරකරුවෙකු ලෙස සේවය කරන අයෙකුගෙන් ප්‍රකාශයක් සටහන් කොට ගෙන ඇති අතර, ඔහු ප්‍රකාශ කර ඇත්තේ, 2018.05.17 දින ඔහු උදෑසන රාජකාරියට වාර්තා නොකළ බවත්, ඔහුට යෙදී තිබුණේ රාත්‍රී රාජකාරී බවත්, රාජකාරියට පැමිණි

අවස්ථාවේදී ලැප්ටොප් යන්ත්‍රයක් නැතිවී ඇති බව දැනගන්නට ලැබුණු බවත්, මෙම පරිගණක යන්ත්‍රය අරගෙන තියෙන්නේ රුවනි බවට සියලු දෙනා පවසන බවත් ය.

එමෙන්ම, 1 වන වගඋත්තරකරු සමඟ වැඩිදුර පරීක්ෂණ සඳහා මැදිරිගිරිය රෝහල වෙත පැමිණි පොලිස් කොස්තාපල් 38193 බණ්ඩාර නිලධාරියා විසින් පැය 12.25ට බුලත්සිංහගලගේ ලහිරු වලින්ද යන රෝහල් මුරකරුවෙකුගෙන් ප්‍රකාශයක් ලබාගෙන ඇත. ඔහු ප්‍රකාශ කර ඇත්තේ, 2018.05.17 වන දින ඔහු මැදිරිගිරිය රෝහලේ දිවා මුර රාජකාරි කළ බවත්, එදින සවස 4.30ට පමණ ලැප්ටොප් එකක් නැතිවූ බව ආරංචි වූ බවත් ය.

එසේම, පොලිස් කොස්තාපල් 38193 බණ්ඩාර නිලධාරියා විසින් පැය 12.45ට රෝහලේ කම්කරුවෙකු ලෙස සේවය කරන සාලිය මෙන්ඩිස් වික්‍රමසිංහ යන අයගෙන් ද ප්‍රකාශයක් සටහන් කරගෙන ඇති අතර, ඔහු ප්‍රකාශ කොට ඇත්තේ, ඔහු 2018.05.17 දින සවස 06.30ට රාජකාරි සඳහා රෝහලට පැමිණි අවස්ථාවේදී රෝහලේ බෙහෙත් විදින කාමරයේ තිබූ ලැප්ටොප් පරිගණකයක් නැතිවී ඇති බව ආරංචි වූ බවත් ය.

පැමිණිලිකාරිය අත්අඩංගුවට ගැනීමෙන් පසු ඇයගෙන් ප්‍රකාශයක් සටහන් කොට ඇති බව මැදිරිගිරිය පොලිස් ස්ථානයේ සුළු පැමිණිලි සටහන් පොතෙහි 2018.05.23 වන දින පැය 15.00ට පිටුව 322, ඡේදය 365 යටතේ යොදා ඇති සටහන අනුව පෙනී යයි. එම ප්‍රකාශය අනුව ලැප්ටොප් පරිගණකයක් සොරාගත් බවට එල්ල කර ඇති චෝදනාව පැමිණිලිකාරිය විසින් ප්‍රතික්ෂේප කර ඇත.

තවද, 2018.05.24 වන දින පෙ.ව.11.00ට පැමිණිලිකාරිය අධිකරණය වෙත ඉදිරිපත් කිරීම සඳහා රැගෙන ගොස් ඇති බව ද මැදිරිගිරිය පොලිස් ස්ථානයේ දෛනික තොරතුරු සටහන් පොතෙහි 2018.05.24 වන දින පැය 11.00ට පිටුව 55, ඡේදය 4262 යටතේ යොදා ඇති සටහන අනුව නිරීක්ෂණය වේ. 2 වන වගඋත්තරකරු විසින් නඩු අංක B 544/18 යටතේ මැදිරිගිරිය මූලික රෝහලේ ඉන්ජෙක්ෂන් කාමරයේ තිබූ ඒසර් වර්ගයේ ලැප්ටොප් පරිගණක යන්ත්‍රයක් සොරා ගැනීමේ චෝදනාව මත හිගුරක්ගොඩ මහේස්ත්‍රාත් අධිකරණය වෙත පැමිණිලිකාරිය ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වේ.

මෙම පැමිණිල්ලට අදාළව 2018.11.27 වන දින කොමිෂන් සභාවේදී පැවති පරීක්ෂණයේදී 1 වන වගඋත්තරකරු ප්‍රකාශ කර ඇත්තේ 2018.05.23 වන දින මැදිරිගිරිය පොලිස් ස්ථානය වෙත ලද ලැප්ටොප් පරිගණකයක් සොකරම් කිරිමට අදාල පැමිණිල්ල සම්බන්ධයෙන් සිදුකරන ලද විමර්ශනයෙන් අනතුරුව ඉදිරිපත් වූ සාක්ෂි සලකා බලා සාධාරණ වූ තොරතුරු මත සැකපිට 2018.05.23 දින පැය 12.40ට පැමිණිලිකාරිය අත්අඩංගුවට ගනු ලැබූ බවයි.

1 වන වගඋත්තරකරු විසින් සිදුකරන ලද විමර්ශනයේදී ලැප්ටොප් පරිගණකය නැතිවීම සම්බන්ධයෙන් මැදිරිගිරිය රෝහලේ සේවකයින්ගෙන් සාක්ෂි හා ප්‍රකාශ සටහන් කරගෙන ඇති බව නිරීක්ෂණය වන අතර, මෙකී ප්‍රකාශ හා සියළුම සාක්ෂිවල සඳහන් කරුණු පිළිබඳව අවධානය යොමු කිරීමේ දී මෙම පැමිණිලිකාරිය විසින් අදාළ ලැප්ටොප් පරිගණකය සොරකම් කරනු දුටු බවට කිසිදු සාක්ෂියක් ඉදිරිපත්

වී නොමැති බව පෙනී යයි. එකී සාක්ෂිකරුවන් ඔවුන්ගේ සාක්ෂි මගින් දන්වා ඇත්තේ, අදාළ සොරකම පිළිබඳව පසුව දැනගන්නට ලැබුණු බව ය. එමෙන්ම, සාක්ෂිකරුවන් අතරින් රෝහලේ සෞඛ්‍ය කාර්ය සහායකයෙකු වන වන්සූරිය මුදියන්සේලාගේ සමන් බණ්ඩාර යන අය, සෞඛ්‍ය මුරකරුවෙකු වන රාජපක්ෂ පතිරනලාගේ නාමල් උදයකුමාර යන අය සහ රෝහලේ කම්කරුවෙකු ලෙස සේවය කරන සාලිය මෙන්ඩිස් වික්‍රමසිංහ යන අය විසින් ඔවුන්ගේ ප්‍රකාශ ලබා දීමේදී මීට පෙර රෝහලේ ඇතැම් සේවකයන්ගේ භාණ්ඩ නැතිවූ අවස්ථාවලදී එම භාණ්ඩ පැමිණිලිකාරිය විසින් සොරකම් කළ බවට අනාවරණය වී ඇති බැවින් මෙම ලැප්ටොප් පරිගණකය ද පැමිණිලිකාරිය ගන්නට ඇතැයි සැක කරන බව පමණක් ප්‍රකාශ කර ඇති බව පෙනී යයි.

කෙසේවෙතත් 1 වන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම් අනුව මෙම පැමිණිලිකාරිය අත්අඩංගුවට ගැනීම සඳහා හේතුවක් වී ඇත්තේ, ඉහත කී රෝහලේ සේවකයින් විසින් මෙම සොරකම සම්බන්ධයෙන් ලබා දී ඇති ප්‍රකාශයන් ය.

1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 32(ආ) වගන්තිය අනුව යම් තැනැත්තෙකුට විරුද්ධව සාධාරණ පැමිණිල්ලක් ලැබී තිබේද, එසේ නම් එම තැනැත්තා සිරභාරයට ගත හැකි බව සඳහන් වේ. මෙහිදී අදාළ තැනැත්තාට විරුද්ධව සාධාරණ වූ පැමිණිල්ලක් ලැබී තිබේද යන්න තහවුරු කර ගැනීම සඳහා 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 109(5) වගන්තියෙහි සඳහන් ආකාරයට ඒ පිළිබඳ සිද්ධි හා අවස්ථානුගත කරුණු විමර්ශනය කිරීමට ද වරදකරු සොයා සිරභාරයට ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීමටද බලය ලැබී තිබේ.

මෙම පැමිණිලිකාරියට එරෙහිව පොලීසිය වෙත ලද පැමිණිල්ල සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශවය විසින් ඉහත කී 109(5) වගන්තිය ප්‍රකාරව විමර්ශනයක් ආරම්භ කර ඇති අතර, එකී විමර්ශනයේදී සාක්ෂි සටහන් කරගෙන ඇත. වගඋත්තරකාර පාර්ශවය වෙත ලැබී ඇති සියළුම ප්‍රකාශ හා සාක්ෂිවල ඇති කරුණු සලකා බැලීමේදී පැමිණිලිකාරිය විසින් අදාල සොරකම සිදුකළ බවට සැකයක් පවතින බව පමණක් හුදු ප්‍රකාශ කර ඇති අතර, පැමිණිලිකාරිය විසින් අදාළ ලැප්ටොප් පරිගණකය සොරකම් කළ බවට තහවුරු කළ හැකි ආකාරයේ කිසිදු ඇසින් දුටු සාක්ෂියක් හෝ වෙනත් පරිවේශණීය සාක්ෂියක් වගඋත්තරකාර පාර්ශවය වෙත ලැබී නොමැති බව නිරීක්ෂණය වන අතර, ලැප්ටොප් පරිගණකය නැති වූ බවට පොලිස් ස්ථානය වෙත ලැබී තිබූ මුල් පැමිණිල්ල මගින් ද පැමිණිලිකාරිය මෙකී සොරකම සිදුකළ බවට කරුණු ඉදිරිපත් කර නොමැති බව ද පෙනී යයි.

ඒ අනුව 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 32(ආ) වගන්තිය ප්‍රකාරව පැමිණිලිකාරියට එරෙහිව සාධාරණ පැමිණිල්ලක් වගඋත්තරකාර පාර්ශවය වෙත ලැබී නොමැති බවටත්, අදාළ සොරකම සම්බන්ධයෙන් සිදුකරනු ලැබූ විමර්ශනය අනුව ලැබී ඇති කිසිදු සාක්ෂියක් මගින් පැමිණිලිකාරිය එකී සොරකම සිදුකළ බවට කරුණු අනාවරණය වී නොමැති බවටත්, පැමිණිලිකාරිය මෙකී වරද සිදුකර ඇති බවට සාධාරණ සැකයක් මතුකර ගැනීම සඳහා වගඋත්තරකාර පාර්ශවයේ විමර්ශනයෙන් තොරතුරු කිසිවක් ලැබී නොමැති බවටත් නිරීක්ෂණය වේ. එහිදී හුදු ප්‍රකාශ මත පමණක්

ක්‍රියා කරමින් විධිමත් හා පුළුල් විමර්ශනයකින් තොරව පැමිණිලිකාරිය අත්අඩංගුවට ගෙන ඇති බව ද පෙනී යයි.

තවද, පැමිණිලිකාරියට එරෙහිව හිඟුරක්ගොඩ මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වූ අංක 72465 දරණ නඩුවේ තීන්දුව 2023.02.07 වන දින ලබා දී ඇති අතර, එම තීන්දුවට අනුව පැමිණිලිකාරියගේ වරදකාරීත්වය ඔප්පුකර නොමැති බව තීරණය කරමින් පැමිණිලිකාරිය නිදොස් කොට නිදහස් කර ඇති බව නිරීක්ෂණය වේ.

<u>නිගමනය</u>

ඉහත දක්වන ලද සියලු කරුණු සමස්තයක් වශයෙන් ගෙන සලකා බැලීමේ දී 1979 අංක 15 දරණ අපරාධ නඩුවිධාන සංග්‍රහය පනතේ 32(ආ) වගන්තිය ප්‍රකාරව පැමිණිලිකාරියට එරෙහිව සාධාරණ වූ පැමිණිල්ලක් ලැබී නොතිබියදී සහ එම පනතේ 109(5) වගන්තිය ප්‍රකාරය සිදුකරන ලද විමර්ශනයේදී හෝ පැමිණිලිකාරිය වරදක් සිදුකර ඇති බවට තහවුරු වී නොතිබියදී පැමිණිලිකාරිය අත්අඩංගුවට ගැනීම තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 13(1) ව්‍යවස්ථාවෙහි සඳහන් නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු සිරභාරයට ගැනීම නොකළ යුත්තේය යන පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම 1 වන වගඋත්තරකරු විසින් උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

එසේම, තමා යටතේ සිටින නිලධාරීන් නීතියට අනුව කටයුතු කරන්නේදැයි අධීක්ෂණය කිරීමට ස්ථානාධිපතිවරයා විෂයෙහි වගකීමක් පවතින බවත්, එසේ කටයුතු නොකළහොත් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙහි සඳහන් නීතිය පසිදලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය යන අයිතිවාසිකම කඩ කිරීම සම්බන්ධයෙන් වගකීමෙන් බැඳෙන බවත් **<u>මොහොමඩ් රෂීඩ් ෆාතිමා ෂර්මිලා</u> එදිරිව <u>පො.සැ. 31118 කේ.ඩබ්.ජී. නිශාන්ත සහ තවත් අය</u> (SC FR Application No. 398/2008)** නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කර ඇත.

ඉහතින් දක්වා ඇති පරිදි 1 වන වගඋත්තරකරු විසින් මැදිරිගිරිය රෝහලේ ලැප්ටොප් පරිගණකයක් අස්ථානගත වීමට අදාළ පැමිණිල්ල සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා පිටත්ව ගොස් ඇත්තේ 2 වන වගඋත්තරකරුගේ නියෝග පරිදි වන බවට පොලිස් ස්ථානයේ උධෘත අනුව නිරීක්ෂණය වන බැවින්, එකී පරීක්ෂණ කටයුතු අතරතුරදී 1 වන වගඋත්තරකරු විසින් අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කරන ලද පැමිණිලිකාරිය, අදාළ වරද සිදු කර ඇති බවට ප්‍රමාණවත් පරිදි සාක්ෂි ඉදිරිපත්ව තිබේ ද යන්න විමසා බැලීමකින් තොරව නඩු අංක B 544/18 යටතේ මැදිරිගිරිය මූලික රෝහලේ ඉන්ජෙක්ෂන් කාමරයේ තිබූ ඒෂර් වර්ගයේ ලැප්ටොප් පරිගණක යන්ත්‍රයක් සොරා ගැනීමේ චෝදනාව මත හිඟුරක්ගොඩ මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම තුළින් 2 වන වගඋත්තරකරු විසින් සිය අධීක්ෂණ වගකීම නිසි පරිදි ඉටු කිරීමට අපොහොසත්ව ඇති බව පෙනීයයි.

එසේහෙයින් ඉහත කී නඩු තීරණය තුළින් ද දක්වා ඇති පරිදි 2 වන වගඋත්තරකරු විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාවෙහි සඳහන් නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය යන පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම ද උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශය ඉදිරිපත් කර සිටී.**

01. 1 වන සහ 2 වන වගඋත්තරකරුවන් විසින් එක් අයෙකුගෙන් රුපියල් පන්දහස (රු.5,000/)ක මුදලක් බැගින් රුපියල් දසදහස (රු.10,000/-)ක මුදලක් පැමිණිලිකාරිය වෙත වන්දි වශයෙන් ගෙවිය යුතු ය.

02. 1 වන සහ 2 වන වගඋත්තරකරුවන් මෙම සිදුවීමේදී ක්‍රියා කර ඇති ආකාරය පිළිබඳව පරීක්ෂණයක් පවත්වා සුදුසු පියවර ගැනීමට පොලිස්පතිවරයා විසින් කටයුතු කළ යුතු අතර, එලෙස ගනු ලබන පියවර සම්බන්ධයෙන් කොමිෂන් සභාව දැනුම්වත් කළ යුතු ය.

2025. 04 . 24 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකාරිය විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී.දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු(හිටපු)
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් අනෙක් පිටුවෙහි ඇත.

පිටපත්-: 01. අමාත්‍යතුමා - කරුණු දැනගැනීම සඳහා
මහජන ආරක්ෂක අමාත්‍යාංශය ,
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

02. පොලිස්පති - අදාළ නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා
ශ්‍රී ලංකා පොලීසිය

සැ.යු. - අදාළ මුදල "මුදල් ඇණවුමක්" මගින් පැමිණිලිකාරිය වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන්න.